# වම්බටු

## *සොලනම් මෙලන්ජිනා - Solanum melongena*

## *කුලය - සොලනේසි*

### දේශගුණික අවශ්‍යතා

මුහුදු මට්ටමේ සිට මීටර් 1300 පමණ උස්වූ ප්‍රදේශ දක්වා වම්බටු වගා කල හැකිය. පහතරට තෙත්, අතරමැද හා වියළි කලාපවලද, මැදරට තෙත් හා අතරමැද කලාපයේද, උඩරට අතරමැද කලාපයේද මෙම බෝගය ඉතා සාර්ථකව වගා කෙරේ.

### පස

හොඳින් ජලවහනය සිදුවන සැහැල්ලු පස් වම්බටු වගාවට සුදුසුය. පසෙහි පී.එච් අගය 5.5-5.8 පැවැතිම වඩා යෝග්‍යය.

### බිම් සකස් කිරීම

උදැල්ලකින් හෝ ට්‍රැක්ටරයක් මාර්ගයෙන් හෝ බිම පෙරලා, මට්ටම් කරන්න. වම්බටු මිරිස් වැනි සොලනේසි කුලයේ බෝග කන්න දෙකක්වත් වගා නොකල බිමක් වීම විශේෂයෙන් වැදගත්ය.

### නිර්දේශිත ප්‍රභේද

**එස්.එම්-164**

මෙම ප්‍රභේදය බැක්ටීරියා හිටුමැරීමට ඔරොත්තු දෙන, දම් වර්ණයෙන් යුතු ඵල ලබා දෙන ප්‍රභේදයකි. ඵල මධ්‍යම ප්‍රමාණයෙන් යුක්ත වන අතර හැඩයෙන් සිලින්ඩරාකාරය. පුෂ්ප දම් වර්ණයෙන් යුක්තය. මෙම ප්‍රභේදය තෙත් වියළි හා අතරමැදි කලාපවලට සුදුසුය. ජල සම්පාදනය සහිතව වගා කිරීමෙන් හෙක්./ටොන් 15-18 දක්වා අස්වැන්නක් ලබාගත හැකිය.

**තින්නවේලි දම්**

මෙම ප්‍රදේශයේ ඵල තද දම්පාට දිලිසෙන ස්වභාවයකින් හා දිගැටි හැඩයකින් යුතුය. පුෂ්ප කඳ හා පත්‍ර නාරටි ද දම්පාටය. වැඩි වියලි දේශගුණයක් සහිත උතුරුප්‍රදේශයට වඩා සුදුසුය.

**පාදාගොඩ**

මෙම ප්‍රභේදයේ ඵල, දම්පාට ඉරි සහිතය. තරමක් පිම්බුනු සිලින්ඩරාකාර හැඩයක් ඇත. කඳ හා පත්‍ර නාරටි කොලපාටය. මල් ලා දම්පාටක් ගනී. බැක්ටීරියා අංගමාරයට ඔරොත්තු දෙන ප්‍රභේදයකි. තෙත් හා අතර මැදි කලාපවලට යෝග්‍යය.

### බීජ අවශ්‍යතාවය

හෙක්ටයාරයට ග්‍රෑම් 300

### තවාන් පිළියෙල කිරීම

වම්බටු සඳහා හොඳින් හිරුඑළිය ලැබෙන ස්ථානයක සැකසූ උස් තවාන් සුදුසු වන අතර බීජ සිටුවීමට පෙර තවාන් පාත්ති ජීවානුහරණය කල යුතුය. පාත්ති මතුපිට යොදන ලද පස්: ගොම 1:1 තුනී තට්ටුව මතුපිට අඟල් 6 පරතරය ඇතිව පේලි දිගේ බීජ දමා සියුම් පස්වලින් වසා, පිදුරු තට්ටුවකින් තවාන් ආවරණය කරන්න. මීටර් 1 පළල මීටර් 3 දිග තවාන් පාත්තියක් බටු බීජ ග්‍රෑම් 30 සඳහා සෑහේ. දින 25-30 ගතවූ පසු, පැල ක්ෂෙත්‍රයේ සිටුවීමට යෝග්‍ය තත්වයට පත් වේ.

යල කන්නයේදී වර්ෂාව ලැබීමත් සමඟ හා මහ කන්නයේ අධික වර්ෂාවෙන් පසු පැල සිටුවන්න.

### පැල සිටුවීම හා නිර්දේශිත පරතරය

සෙ.මී. 90×60 පරතරය ඇතිව සෙ.මී. 30×30×30 ප්‍රමාණයට පිළියෙල කරගත් වලවල්වලට කාබනික පොහොර යොදා දින 25 - 30 වූ බීජ පැල, එක් වලක එක බැගින් සිටුවන්න. ඉන්පසු ජල සම්පාදනය කොට, හිරු රශ්මිය අධිකව ඇත්නම් කොළ අතු වලින් ආවරණය කරන්න. සවස් වරුවේ පැල සිටුවීම වඩා යෝග්‍යය.

### පොහොර යෙදීම

වම්බටු වගාවේදී බීජ පැල සිටුවීම සඳහා පිළියෙල කල වලවල් වලට කාබනික පොහොර අවම වශයෙන් දෝතක් (ග්‍රෑම් 250-300) පමණවත් යෙදිම කල යුතුය. පැල සිටුවීමට දින 2 කට පෙර, මූලික පොහොර

ලෙස යෙදිය යුතු රසායනික පොහොර ප්‍රමාණයද වලවල්වලට යොදා පස් සමඟ කලවම් කරන්න.

## රසායනික පොහොර

| | යූරියා<br>හෙ./කි.ග්‍රෑ. | ත්‍රිත්ව සුපර් පොස්පේට් හෙ./කි.ග්‍රෑ | මියුරියේට් ඔෆ් පොටෑෂ් හෙ./කි.ග්‍රෑ. |
|---|---|---|---|
| පැල සිටුවීමට පෙර | 75 | 350 | 110 |
| සති 4 දී | 75 | - | - |
| සති 8 දී | 75 | - | 110 |
| සති 12 දී | 75 | - | - |

## ජල සම්පාදනය

වියලි කලාපයේ වර්ෂා ජලයෙන්ද බටු වගා කල හැකිය. සාර්ථක අස්වැන්නක් ලබාගැනීමට හා ලාභදායි වගාවක් ලෙස පවත්වා ගැනීම සඳහා ජල සම්පාදනය කළයුතු ය. වියළි කාලගුණයක් ඇතිවිට අවම වශයෙන් දින 5 කට වරක් ජල සම්පාදනය කරන්න.

## වල් පැලෑටි පාලනය

බටු පැල සිටුවා සති 2, 4, 7, 9, 12 යන අවස්ථාවලදී වල් පැල ඉවත්කිරීම කල යුතුයි.

## රෝග පාලනය

### බැක්ටීරියා හිටුමැරීම

බටු වගාවට හානිදායක ප්‍රධානතම රෝගය බැක්ටීරියා හිටුමැරීමයි. පොළවේ ජීවත්වන බැක්ටීරියාවක් මාර්ගයෙන් වැළඳෙන මෙම රෝගය නිසා පළමුවෙන්ම පැල මලානික වීමත් පසුව පැල මිය යෑමත් සිදුවේ. මෙම රෝග පාලනය සඳහා ඔරොත්තු දෙන ප්‍රභේදයක් වගා කිරීම හා බෝග මාරුවක් අනුගමනය කිරීම වැදගත්ය.

## කෘමි පාලනය

### කරටි හා ගෙඩි විදින පණුවා

දිගින් දිගටම එකම ක්ෂේත්‍රයක බටු වගා කිරීමේදී මෙන්ම බටු වගාවෙන් පසු ශාක කොටස් නිදැල්ලේ භූමියේ දිරායෑමට සැලැස්වීමෙන් ඵළඟ කන්නයේදී මෙම හානිය උත්සන්න වීමට ඉඩ ඇත.

### පාලනය

වගා කර ඇති ශාක වල කරටිවල මෙම හානිය පළමුවෙන්ම දක්නට ලැබුනු විට එම කරටි කොටස් ශාකයෙන් කඩා ඉවත් කර විනාශ කර දමන්න.

කරටි විදින කෘමි හානිය වැඩි වශයෙන් දක්නට ලැබෙන භූමියක බටු වගාකරන විට බටු පැල සිටුවන අවස්ථාවේදී සකසාගත් වලවල්වලට කාබොෆියුරාන් ස්වල්පයක් බැගින් යොදන්න.

මල් හා කරල් හටගත් අවස්ථාවේදී සුදුසු කෘමිනාශකයක් ඉසීමෙන් මෙම හානිය පාලනය කර ගත හැකිය. නිර්දේශිත කෘමිනාශකයක් යොදා අවම වශයෙන් දින 7-10 ගතවූ පසු පමණක් අස්වැන්න නෙලන්න.

මෙයට අමතරව මයිටාවෙන් හා පත්‍ර කීඩෑවන් නිසාද බටු වගාවට හානි ඇතිවිය හැකිය.

## අස්වැන්න නෙලීම

වගා කර ඇති ප්‍රභේදය හා පාරිසරික තත්ව අනුව පැල සිටුවා සති 10-12 අතර දී පළමු අස්වැන්න නෙලා ගත හැකිය. මින්පසුව දින 7 කට වරක් බැගින් නැවත අස්වැන්න නෙලිය හැකිය. පිහියකින් නටුව කපා කරල් වෙන්කර ගන්න.

## අස්වැන්න

බටු වගාවක අස්වැන්න, ප්‍රභේදය හා වගා පාලනය මත වෙනස් වේ. ජල සම්පාදනය කොට නිර්දේශිත ප්‍රභේදයක් වගා කිරීමෙන් හෙක්ටයාර් එකකට ටොන් 15-18 දක්වා අස්වැන්නක් ලබාගත හැකිය. මෙම අස්වැන්න නෙලීම් වාර 8-10 මගින් ලබාගත හැකිය.

## පසු අස්වනු කටයුතු

නරක්වූ හා කෘමි හානිවලට ලක්වූ ගෙඩි ඉවත් කරන්න.